සියළුම හිමිකම් ඇවිරිණි]
All Rights Reserved ]

පාසල් වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන විභාගය

# 2023

## I පත්‍රය

නැණ ලොවට පා නගන හපනුන්ට මඟ කියන

## "අදිති"

පැය 01 යි

### පෙරහුරු විභාගය - 01

විභාග අංකය ..............................

**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40 ක් ඇත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණ නිවැරදිය. | V/I/S/CH |

- **පහත දැක්වෙන අංක 1 හා 2 ප්‍රශ්න වල නොගැළපෙන රූපය යටින් ඉරක් අඳින්න.**


(01)



(1)



(2)


(3)


(02)


(1)



(2)



(3)

(03) පළමු කොටුව තුළ ඇති රූප කණ්ඩයට ඇතුළත් කිරීමට වඩාත් ගැළපෙන රූප ඇතුළත් පිළිතුර තෝරන්න.





(1)



(2)


(3)

(04) පහත ගණක රාමු දෙක ඇසුරින් පිළිතුර තෝරන්න.



A



B

ගණක රාමු දෙකෙහි නිරූපිත සංඛ්‍යා දෙකෙහි අන්තරයෙන් B ගණක රාමුවේ දහය ස්ථානයේ ස්ථානීය අගය අඩු කළ විට ලැබෙන පිළිතුර වනුයේ,

1. 24967 2. 24937 3. 27977

- **කවිය කියවා අසා ඇති ප්‍රශ්නවලට සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

මන බඳනා බිඟු නදිනා
රුව රඳනා පෙති සැලෙනා
සුවඳ දෙනා එමල සිනා
පියුම මනා යාය පිනා


(05) මෙම කවියෙන් විස්තර කරන්නේ,

1. මී මැස්සන් ගැන ය. 2. ළමයෙක් ගැන ය. 3. නෙලුම් මල ගැන ය.

(06) මන බඳනා යන්නෙහි අදහස දෙන තනි වචනය සහිත පිළිතුර වනුයේ,


1. මනස්කාන්ත 2. කන්කලු 3. දර්ශනීය

(07) හිස්තැනට ආ යුතු සංඛ්‍යාව තෝරන්න.





1. 45 2. 81 3. 54

(08) පහත හැඩතලයේ ඇති සෘජුකෝණ ගණන, සෘජුකෝණයට වඩා අඩු කෝණ ගණන, සෘජුකෝණයට වඩා වැඩි කෝණ පිළිවෙළින් දක්වා ඇති පිළිතුර වනුයේ,



1) 5, 4, 2 2) 4 ,5,2 3) 5,2,4

(09) නදුල සහ කෙවීන් දල්වන ලද ඉටි පන්දම් හයක් වෙන වෙන ම පහත රූපයේ දැක්වේ.



නදුල කෙවීන්

- රූප සටහන් වලට අනුව දක්වා ඇති පිළිතුරු වලින් නිවැරදි පිළිතුර තෝරන්න.

1. නදුලගේ ඉටිපන්දම් කිහිපයක් හෝ එකක් වැඩි වේලාවක් දැල්වෙයි.
2. කෙවීන්ගේ ඉටිපන්දම් කිහිපයක් හෝ එකක් වැඩි වේලාවක් දැල්වෙයි.
3. දෙදෙනාගේ ම ඉටිපන්දම් කිහිපයක් හෝ එකක් වැඩි වේලාවක් දැල්වෙයි.

(10)





ඉහත රූප සටහනේ දක්වා ඇත්තේ වර්ග කිරීම සඳහා තබන ලද කසළ බඳුන් තුනකි. 'ලර් හා ක බඳුන්වලට දැමිය හැකි අපද්‍රව්‍ය පිළිවෙළින් දැක්වෙන පිළිතුර වනුයේ,

1. ජංගම දුරකථන බැටරි, ප්ලාස්ටික්, වියළි ශාක පත්‍ර
2. පොලිතීන්, ප්ලාස්ටික්, වියළි ශාක පත්‍ර
3. වීදුරු, ජංගම දුරකථන බැටරි, පිදුරු

(11) අයියා මගෙන් රු.20.00 ක් ඉල්ලාගෙන රු.30.00 ක් මට ආපසු දුන්නේ ය. දැන් මා ළඟ ඇති මුදල රු.70.00 කි. ඒ අනුව කලින් මා ළඟ තිබූ මුදල වනුයේ,

1. රු.60.00 2. රු.50.00 3. රු.80.00

(12)




- ඉහත A හා B භාජන දෙකේ ඇති ජලයෙන් හරි අඩක් ඉවතට ගෙන භාජන දෙකට මාරු කර වත් කරනු ලබයි. ඒ අනුව භාජන දෙකේ ඇති ජලයෙහි උණුසුම පිළිබඳ ඔබට පැමිණිය හැකි නිගමනය වන්නේ,

1. A භාජනයේ උණුසුම වැඩි ය.

2. B භාජනයේ උණුසුම වැඩි ය.

3. A හා B භාජන දෙකෙහි ම උණුසුම සමාන ය.

(13) සදෙව්මා කඩයට ගොස් පාවහන් යුගලක් මිලදී ගත්තා ය. එහි මිල සටහන් කර තිබුණේ රු.999.99 ක් ලෙස ය. ඇය මුදලාලිට රු.1000.00 නෝට්ටුවක් දුන්නේ නම් ඇයට ඉතිරි ලෙස ලැබෙන මුදල සීයෙන් පංගුවක් ලෙස දක්වා ඇති පිළිතුර වනුයේ,

1. $\frac{1}{100}$ 2. $\frac{10}{100}$ 3. $\frac{90}{100}$

- රූකඩ සංදර්ශනයක් නැරඹීමට සඳහා ප්‍රවේශ පත්‍ර මිල දී ගැනීමට සදීෂා, කවීෂා, අමාෂා, වගීසා සහ නතාෂා පෝළියට සිටගෙන සිටියි.

මුල



- ➢ වගීෂාට ආසන්නයෙන් ම ඉදිරියෙන් හෝ පිටුපසින් සදීෂා හෝ අමාෂා නැත.
- ➢ සදීෂාට පිටුපසින් නතාෂා සහ තවත් දෙදෙනෙක් සිටිති.
- ➢ පෝළියේ අග සිටින්නේ නතාෂා ය. වගීෂාට ඉදිරියෙන් තිදෙනෙක් සිටිති. මේ තොරතුරු වලට අනුව,


(14) පෝළියේ ඉදිරියෙන් ම සිටින්නේ,

1. කවීෂා 2. අමාෂා 3. සදීෂා

(15) වගීෂාට අසලින් ම ඇයට ඉදිරියෙන් සිටින්නේ,


1. සදීෂා 2. අමාෂා 3. කවීෂා

(16) පහත රූපයේ දැක්වෙන්නේ වඩු කාර්මිකයෙකු විසින් නිර්මාණය කර ඇති අතකොලුවක හැඩය ගන්නා ලී කුට්ටියකින් කරන ලද නිර්මාණයකි. එහි ඇති මුහුණත් ගණන දැක්වෙන නිවැරදි පිළිතුර වනුයේ,



1. 7 2. 8 3. 9

(17) පහත රූපයේ දැක්වෙන්නේ බෙහෙත් දියර මැනීම සඳහා භාවිතා කරන භාජනයකි. එම භාජනය සම්පූර්ණයෙන් පිටතට නොයන සේ බෙහෙත් දියර පිරවීම සඳහා අනුගමනය කළ යුතු පියවර ඇතුළත් පිළිතුර තෝරන්න.




1. තේ හැන්දකින් පස් වතාවක් පිරවිය යුතු ය.
2. මේස හැන්දකින් තුන් වතාවක් පිරවිය යුතු ය.
3. තේ හැන්දකින් හය වතාවක් පිරවිය යුතු ය.

- **18 සහ 19 ප්‍රශ්න සඳහා පහත විස්තරය ඇසුරෙන් පිළිතුර තෝරන්න.**

සනකාකාර හැඩැති විශාල පෙට්ටියක කුඩා සනකාකාර බිස්කට් පෙට්ටි සම්පූර්ණයෙන් ම අසුරා ඇත.

(18) විශාල පෙට්ටිය තුළ තිබිය හැකි බිස්කට් පෙට්ටි ගණන විය හැක්කේ,

1. 30 2. 49 3. 64

(19) කුඩා බිස්කට් පැකැට්ටුවක් තුළ බිස්කට් 10 ක් තිබුණේ නම් විශාල පෙට්ටිය තුළ තිබෙන මුළු බිස්කට් පැකට් ගණන වන්නේ,

1. 360 2. 490 3. 640

(20) පඬුවස් බස්සාගේ පින්තූරය සහිත මුදල් නෝට්ටුව වන්නේ,

1. රු.20.00 2. රු.50.00 3. රු.100.00

පහත කවිය ඇසුරෙන් 21 සහ 22 ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.


වසු පැටියෝ ගෙල පසා
මිණිවැල් සෙලවෙන නිසා
රිසි ලෙස ඇඟ නොම කසා
සිටිති තනට ඇස වසා

(21) '' මිණි'' යනුවෙන් හඳුන්වා ඇත්තේ,

1. රන් 2. ගෙජ්ජි 3. මැණික්

(22) ''රිසිලෙස'' යනුවෙන් අදහස් කරන්නේ,

1. උචිත ලෙස 2. කැමති ලෙස 3. සීරුවෙන්




(23) ඉහත රූප සටහනට අනුව කෙසෙල් හැරුණු විට වෙනත් පලතුරු ප්‍රමාණය කොපමණ ද?

1. 40 2. 100 3. 140

(24) මෙහි ඇති මුළු පලතුරු ප්‍රමාණය වනුයේ,

1. 360 2. 250 3. 200

(25) 10m ක් දිග ලණුවක් කෙළවරවල් දෙක එකට තබා ඉන් අනතුරු ව ලණු පොටවල් දෙක ම අසුවන සේ හරි මැදින් කපයි. එවිට ලැබෙන විශාල ලණු කොටසේ දිග සොයන්න.

1. 2m 50cm 2. 6m 3. 5m

(26) ''අමරපාල සිටින්නේ කොතන ද, ලීලපාලත් එතැන ඇති.'' යනුවෙන් අපේ තාත්තා නිතර කියයි. මේ විස්තරයට වඩාත් හොඳින් ගැළපෙන ප්‍රස්තාව පිරුළ වන්නේ,


1. රයිගමයයි ගම්පළයයි වගේ.
2. ඉදිකටුවයි නූලයි වගේ.
3. මහදැණමුත්තගේ නුවණ වගේ.

- **27 හා 28 ප්‍රශ්න සඳහා වඩාත් නිවැරදි අර්ථයක් ලබා දෙන පිළිතුර තෝරන්න.**

(27) 1. කෙසෙල් ගසේ කිහිප වතාවක් එල හට ගනියි.
2. දූරියන් රසවත් පලතුරකි. එහි බීජ කිහිපයක් දැක ගත හැකි ය.
3. රාබු, අල සිටවා පැළ ලබා ගන්නා එළවළුකි.

(28) 1. සැම විට ම ත්‍රිකෝණයක පාද තුන ම සමාන වේ.
2. ත්‍රිකෝණයක දිගින් වැඩි ම පාදයට වඩා අනෙක් පාද දෙකෙහි දිගෙහි එකතුව වැඩි ය.
3. සැම චතුරස්‍රයකට ම සමමිතික රේඛා හතරක් තිබේ.

(29) පසිඳු ළඟ කාසි 20 ක් තිබුණු ආකාරය පිළිබඳ සටහනක් මෙහි දැක්වේ. මේ කාසි සියල්ලේ වටිනාකම කීයද?




1. රු.85.00 2. රු.95.00 3. රු.75.00

(30) තමාගේ සෙවනැල්ල තමාගේ පාද වලට ආසන්නයේ ම තිබිය නොහැකි අවස්ථාවක් වන්නේ,

1. පස්වරු 2.20 2. පස්වරු 4.30 3. පස්වරු 12.59


(31) පාසලේ පැවැත්වෙන නිවාසන්තර ක්‍රීඩා තරඟයක දී දැකිය නොහැකි සිදුවීමක් විය හැක්කේ,


1. ප්‍රීතිඝෝෂා කිරීම.
2. නිවාස ධජය රැගත් සිසුන්
3. සැඟවුණු ක්‍රීඩකයා සෙවීම.

(32) එක සමාන ගී පටි හතරක් එකිනෙකට අමුණා 42cm ක් දිග තනි ලී පටියක් සේ සකසා ගන්නා ලදි. එසේ සැකසීමේ දී පටි දෙකක් එකට සම්බන්ධ කිරීමේ දී එකක් අනෙක මත 2 cm අසුවන සේ තබා ඇණ ගැසුවේ නම් තනි පටියක් ලෙස සැකසීමට පෙර එක ලී පටියක දිග විය හැක්කේ,

1. 10 cm 2. 11 cm 3. 12 cm

(33) 03 ශ්‍රේණියේ ඉගෙන ගන්නා දරුවෙකු ලියා ඇති අක්ෂර කිහිපයක් පහත දැක්වේ. එහි වැරදියට ලියා ඇති අක්ෂරය තෝරන්න.


1.


2.



3.

(34) ගණිත කර්ම වලට අනුව නිවැරදිව විසඳා ඇති පිළිතුර වන්නේ,

1. 111 + 11 + 1+ 111+ 0 = 234
2. 111 + 11 +1 + 111 x 1 = 234
3. 101 + 11 + 1+ 101x 0 = 214

(35) තරිඳු තම ගෙවත්තේ භෝගයක් සිටුවීම සඳහා කළ ක්‍රියාකාරකමක් පහත දැක්වේ. එහි නිවැරදි අනුපිළිවෙළ තෝරන්න.


A


B


C


D


E

1. B, C, E, D, A
2. C, B, A, E, D
3. C, B, A, D, E

(36) ඔරලෝසු මුහුණතක පැය කටුව හා මිනිත්තු කටුව සරල රේඛාවක් ලෙස පිහිටන අවස්ථාවක් වන්නේ,

1. පෙරවරු 6.00
2. පස්වරු 12.30
3. පස්වරු 3.45

(37) දීර්ඝ කාලයක් පුරා පැවති වියළි කාලගුණය අවසන් කරමින් ඌව හා සබරගමු පළාත්වල මොරසූරන වැසි ඇද හැළුණි. මේ අනුව වැසි ඇද හැළුණු දිස්ත්‍රික්ක දෙකක් පිළිවෙළින් සටහන් ව ඇත්තේ,

1. රත්නපුර / බදුල්ල
2. කතරගම / කෑගල්ල
3. මොනරාගල / කෑගල්ල

(38) නිවැරදිව විරාම ලකුණු යොදා ඇති වාක්‍ය තෝරන්න.

1. අම්මාත්, තාත්තාත්, මල්ලීත්, මමත් ගමට ගියෙමු.
2. අම්මාත් තාත්තාත් මල්ලීත් මමත් ගමට ගියෙමු.
3. අම්මා ද, තාත්තා ද, මල්ලී ද මම ද, ගමට ගියෙමු.

(39) කටුබැද්ද ගම්මානයේ පිහිටි වැව නිරන්තරයෙන් ජලය පිරී ඇත. එමගින් සියලු ගම්වැසියන්ට අත්විඳින්නට සිදුවන වඩාත් ප්‍රභලත ම ප්‍රයෝජනය වන්නේ,

1. ගොවිතැන් කටයුතු ඉතා හොඳින් සාරවත් ව කර ගත හැකි වීම.
2. ගඩොල් නිෂ්පාදනය වැඩි වීම.
3. සනීපාරක්ෂක කටයුතු සඳහා වැවේ ජලය භාවිතා කිරීම.

(40) ගමනකින් $\frac{1}{4}$ ක් පාපැදියෙන් ගමන් කළ ජලිත, ගමන අවසන් කිරීමට 12km 750m ක දුරක් ගමන් කිරීමට ඇති බව ප්‍රකාශ කළේ ය. ගමනේ මුළු දුර කොපමණ ද?

1. 17km
2. 4km 250m
3. 16km 750m